ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1988 අංක 75 දරන
# මානසික උපප්‍රකෘති ළමා පාසැලේ
# ශුභ සාධක සමිතිය
# (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි.
තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

**එල්. ඩී.—ඕ. 44/87**

**මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" යනුවෙන් හඳුන්වන ලබන හා සඳහන් කරනු ලබන සමිතියක් එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සමිතියේ පරමාර්ථ සහ එකී සමිතියට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලීම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතියේ දැනට සාමාජිකයන් වන සියලු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු "මානසික උපප්‍රකෘති ළමා පාසැලේ ශුභ සාධක සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබාගෙන, එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ සාමාන්‍ය පරමාර්ථ.

3. සංස්ථාවේ සාමාන්‍ය පරමාර්ථ වනුයේ, මානසික උපප්‍රකෘති ස්වභාවයේ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම පහත දැක්වෙන ක්‍රම මගින් ප්‍රවර්ධනය කිරීම ය :—

(අ) චිත්‍රා ලේන් පාසැල, සීමාසහිත වැඩිහිටි ආරක්ෂිත වැඩපළ ගොඩනැගිලි සමිතිය, දිවාකාල රැකවරණ මධ්‍යස්ථාන, ඇගයීමේ සායන සහ නිවාස වැනි ආයතන වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ පිහිටුවීම හා පවත්වාගෙන යාම :

(ආ) මානසික උපප්‍රකෘති ස්වභාවයේ ළමයින් සමාජයට වැඩදායක පිරිසක් බවට පත් කිරීම සඳහා ඔවුන්ගේ සහජ දක්ෂතා අනුව ඔවුන්ට සුදුසු වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම ;

(ඇ) පුහුණු තැනැත්තන් ජාත්‍යන්තර වශයෙන් හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) මහජනයාට, විශේෂයෙන්ම මානසික උපප්‍රකෘති ළමයින්ගේ නෑදෑයින්ට මානසික උපප්‍රකෘති තත්වයට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපනයක් ලබාදීම සහ එවැනි අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම ;

(ඉ) ආණ්ඩුවේ ද දේශීය හා විදේශීය සංගම්වල ද ශුභ පතන්නන්ගේ ද උපකාරය හා සහාය ලබා ගැනීම ;

(ඊ) සමාන අරමුණු හා පරමාර්ථ ඇති යම් ව්‍යාපෘතියක දී හෝ ව්‍යාපාරයක් ආණ්ඩුව සමග හෝ යම් පළාත් පාලන ආයතනයක් සමග හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් දේශයක යම් බලාධිකාරයක් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(උ) මානසික උපප්‍රකෘති රෝගීන් හා ඔවුන්ගේ යැපෙන්නන් නොකඩවා රැකබලා ගැනීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම ; සහ

(ඌ) මානසික උපප්‍රකෘති ළමයින්ට වෙනත් කවර වූවද ආධාර සැපයීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සේවක පිරිස් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ ද සියලු දේ ක්‍රියාවේ යෙදීමේ ද බලය මේ පනතේ සහ සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරන අයට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සමිතියේ ක්‍රියාකාරී කමිටුව හා පාසැලේ අධ්‍යක්ෂකගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව සමන්විත විය යුතු ය.

6. (1) සංස්ථාවේ චංචල හා නිශ්චල සියලු දේපළ කළමනාකරණය කිරීමට හා පාලනය කිරීමට සම්පූර්ණ බලය හා අධිකාරය ඇති භාරකාර මණ්ඩලයක් සංස්ථාවට තිබිය යුතු ය. භාරකාර මණ්ඩලය.

සෑම භාරකරුවෙක්ම, මරණය හෝ ඉල්ලා අස්වීම හෝ ශාරීරික හෝ මානසික අශක්නුතාවකට පත්වීම හෝ භාරකරුවන්ගේ බහුතරයකගේ තීරණයෙන් ඉවත් කරනු ලැබීම සිදුවන තෙක් ධුරය දැරිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය පහත දැක්වෙන අය ගෙන් සමන්විත විය යුතු ය :—

(1) අයින්ති මොනිකා රාජපක්ෂ
(2) ප්‍රෙඩ්රික් රිචඩ් අලස්
(3) කිෂාන් යස්මින් ගුණවර්ධන
(4) වෙලිසියා ශ්‍රීමතී ගුණවර්ධන
(5) ජෝවර්ඩ් ප්‍රනාන්දු
(6) සුනීතා මාලනී රුද්‍රිගු
(7) ශිරාන්තිනී ප්‍රතිභා ද සිල්වා
(8) කුමාරි ගුණසේකර වික්‍රමරත්න
(9) මර්වින් සෙන්ට් සෙබස්තියන් කාසිවෙට්ටි.

සමිතියේ සභාපති භාරකාර මණ්ඩලයේ ප්‍රථම සභාපති විය යුතු ය.

(3) යම් භාරකරුවකු මියයාම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුකොටගෙන භාරකාර මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වුවහොත් ඉතිරි භාරකරුවන් විසින් අවුරුදු පහකට නොඅඩු සාමාජිකත්වයක් සම්පූර්ණ කර ඇති හෝ සංස්ථාවේ සාමාජිකයන් අතරින් ඒ සඳහා අනුප්‍රාප්තිකයකු පත්කර ගත යුතු ය.

(4) භාරකාර මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විය යුතු ය.

7. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් බඳවා ගැනීම.
සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම :

(ආ) සභාපතිවරයකු, ගරු ලේකම්වරයකු සහ ගරු භාණ්ඩාගාරිකවරයකු වශයෙන් නිලධාරීන් ද සාමාජිකයන් විසි දෙනකුගේ උපරිමයකින් යුක්ත කළමනාකරණ කමිටුවක් ද තෝරා පත්කර ගැනීම ;

(ඇ) භාරකාර මණ්ඩලය පත්කිරීම සහ ඔවුන්ගේ බලතල ක්‍රියා කලාපය හා කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, ක්‍රියා කලාපය, කාර්ය හා කර්තව්‍ය ;

(ඉ) කළමනාකාර කමිටුවේ හා භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම හා එම රැස්වීම් පැවැත්වීම, එම රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ඒවායේ ගණපූරණය හා එහි දී කටයුතු කරගෙන යාම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය, එහි අරමුදල්වල භාරය, එහි ගිණුම් තැබීම හා විගණනය ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලද යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන රැස්වීමකට සමාන රැස්වීමක දී එවැනිම ආකාරයකින් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කළ හැකි ය ; එසේ වුවද එවැනි සංශෝධනයකට, වෙනස් කිරීමකට, එකතු කිරීමකට හෝ පරිච්ඡින්න කිරීමකට කළමනාකාර කමිටුවේ පූර්ව අනුමැතිය ලැබී තිබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සමිතියෙන් ගෙවිය යුතු හා සමිතියට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පවත්නා සමිතියේ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සමිතියට අයවිය යුතු සියලුම ණය සහ සමිතිය වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියෝජනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත් දැරීමටත් නීතියෙහි ලා හැකියාව සහ බලය සංස්ථාවට ඇත්තේ ය. තවද, ඒ සියලු දේපළ, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ගණුදෙනු බේරා සෑ දැමීම.

11. සංස්ථාව විසුරුවා හැරීමෙන් හෝ ගණුදෙනු බේරා සෑ දැමීමෙන් පසු, එහි සියලුම ණයතුරුස් හා බැරකම් ගෙවා බේරුම් කිරීමෙන් ඉක්බිති කවර හෝ දේපළක් ඉතිරිව තිබේ නම්, එම දේපළ එම ගණුදෙනු බේරා සෑ දැමීමේ හෝ විසුරුවා හැරීමේ වේලාවේ දී භාරකාර මණ්ඩලයේ අභිමතය පරිදි, මේ සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සමිතියකට හෝ ආයතනයකට දිය යුතු ය; නැතහොත් පැවරිය යුතු ය.

විධිවිධාන සලස්වා නැති කාරණ.

12. මේ සංස්ථාවේ රීතිවල විධිවිධාන සලස්වා නැති යම් කාරණයක් සම්බන්ධයෙන් වූ විට, භාරකාර මණ්ඩලය විසින් භාර ආඥාපනතේ විධිවිධාන ගුරු කොට ගෙන ඒවා අනුගමනය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනා යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො වන්නේ ය.

පාර්ලිමේන්තුවේ පහත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 යි (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.